ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2505/97 - 2026 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2026.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

එල්.ඩී.බී. - 6/2001 (iv)

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 78 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 105 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව.

2026 සැප්තැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මේ රීති 2026 අංක 1 දරන රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් රීති යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මකභාවයට පැමිණිය යුතු ය.

2. (අ) වයස අවුරුදු දහඅටට වැඩි;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන;

(ඇ) පහත දැක්වෙන අවම සුදුසුකම් ලබා ඇති:-

(i) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විෂයයන් හයක් සඳහා සාමාන්‍ය (එස්) සාමාර්ථ ලබා තිබීම; හෝ

(ii) (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට සමාන හෝ ඊට ඉහළ; සහ

(ආ) කොමිෂන් සභාව විසින් පිළිගත්, වෙනත් යම් විභාගයක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම:

එසේ වුවද, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට සමාන හෝ ඊට ඉහළ වෙනත් සුදුසුකම් තීරණය කළ යුත්තේ එක් එක් අවස්ථාව මත පදනම්ව ය. විභාගයේ මට්ටම පිළිබඳව යම් ගැටලුවක් උද්ගත වූ අවස්ථාවකදී, එම ගැටලුව විභාග කොමසාරිස්වරයා විසින් තීරණය කළ යුතු ය; හෝ

(iii) 2002 සැප්තැම්බර් මස 23 වන දිනට, රක්ෂණ නියෝජිතයකු වශයෙන් වසර පහකට නොඅඩු පළපුරුද්දක් තිබීම;

(ඈ) ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් යම් වෘත්තිමය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන පූර්ව බඳවාගැනීමේ පරීක්ෂණයක් සමත්ව ඇති;

(ඉ) දඩයකින් පමණක් දඬුවම් ලැබිය හැකි වරදක් හැර, අපරාධ වරදක් සඳහා වරදකරු වී නොමැති:

එසේ වුව ද, වරදකරු නොවීම, පොලිස් නිෂ්කාශන සහතිකයක් සහ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මගින් තහවුරු කරනු ලැබිය යුතු ය;

(ඊ) රක්ෂණකරුවකුගේ හෝ තැරැව්කරුවකුගේ සේවානියුක්තයකු නොවන; සහ

(උ) මූල්‍ය අවභාවිතය හෝ වංචාව යන පදනම් මත, කොමිෂන් සභාව, රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු විසින් නියෝජිතයකු වශයෙන් ස්වකීය සේවාවෙන් ඕට පෙරාතුව අවසන් කරනු නොලැබූ පුද්ගලයකු වන,

යම් තැනැත්තකු රක්ෂණ නියෝජිතයකු වශයෙන් ලියාපදිංචි කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය.

3. (1) ලියාපදිංචි රක්ෂණ නියෝජිතයකු සෑම වසර තුනක කාලසීමාවකට ම වරක් අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන විභාගය සාර්ථකව සම්පූර්ණ කළ යුතු ය.

(2) (1) වන අනුරීතිය යටතේ අවශ්‍ය කරන පළමු විභාගය මේ රීති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද දිනයේ සිට අවුරුදු තුනක් ඇතුළත සම්පූර්ණ කළ යුතු ය.

(3) (1) වන අනුරීතියේ විධිවිධානයන්ට අනුගත වීමට අපොහොසත් වන යම් රක්ෂණ නියෝජිතයකු, රක්ෂණකරුවකුගේ හෝ රක්ෂණ තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස කටයුතු කිරීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

(4) (1) වන අනු රීතියේ සඳහන් වන අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන විභාගය-

(අ) ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය; හෝ

(ආ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් යම් ආයතනයක්,

විසින් පැවැත්විය යුතු ය.

4. සෑම රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු විසින් ම, අවස්ථාවෝචිත පරිදි, රක්ෂණ නියෝජිතයකු වශයෙන් එකී රක්ෂණකරු හෝ තැරැව්කරු සමඟ ලියාපදිංචිව ඇති සියලු ම තැනැත්තන්ගේ ලේඛනයක් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු ඇතුළත් කොට පවත්වාගෙන යා යුතු ය.

5. 2002 සැප්තැම්බර් මස 23 වන දින අංක 1255/3 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2002 රක්ෂණ නියෝජිත සුදුසුකම් රීති, ඒ යටතේ නීත්‍යානුකූලව සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිවිඡින්න කරනු ලැබේ.

6. මෙම රීතිවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත අදහස් වේ;

"තැරැව්කරු" ,"රක්ෂණ නියෝජිත" සහ "රක්ෂණකරුවකු" යන්නට, පනතේ ඒ සඳහා දී ඇති අර්ථය ම විය යුතු ය;

"කොමිෂන් සභාව" යන්නෙන්, පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදහස් වේ ;

"විභාග කොමසාරිස්වරයා" යන්නෙන්, 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 2 වන වගන්තියේ සඳහන් කර ඇති විභාග කොමසාරිස්වරයා අදහස් වේ; සහ

"ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය" යන්නෙන්, රක්ෂණ ව්‍යාපාරයේ නියැලී සිටින පුද්ගලයන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ සහිතව ලාභ නොලබන සංවිධානයක් වශයෙන් 1982 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද ආයතනයක් අදහස් වේ.

උපලේඛනය

[4 වන රීතිය]

රක්ෂණ නියෝජිතයන්ගේ රෙජිස්ටරය

සමාගමේ නම (රක්ෂණ සමාගම/ රක්ෂණ තැරැව්කරු) :-

අංකය:	නියෝජිත යාගේ සම්පූර්ණ නම	ජා.හැ. අංකය:	උපන්දිනය (වර්ෂය/ මාසය/ දිනය)	ස්ත්‍රීපුරුෂ භාවය (ස්ත්‍රී/පුරුෂ)	නියෝජිතයා ගේ කේතය/ ලියාපදිංචි අංකය:	පත්වීම් දිනය/ සමාගමේ ලියාපදිංචි වූ දිනය	රක්ෂණ ව්‍යාපාරයේ විවිධ පන්ති (දීර්ඝකාලීන/ සාමාන්‍ය/ දීර්ඝ කාලීන සහ සාමාන්‍ය)	දුරකථන අංකය		විද්‍යුත් ලිපිනය	ලිපිනය	
								ස්ථාවර	ජංගම		ස්ථාවර	ලිපි එවිය යුතු ලිපිනය
1												
2												
3												
4												
5												
6												
7												
8												
9												
10												
11												
12												
13												
14												

EOG 09 - 0248